(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 185.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 ඔක්තෝබර් 06 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

371/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය කවරේද;

(ii) මේ වනවිට ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු මුළු සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම සඳහා කටයුතු කර ඇති ප්‍රදේශ කවරේද;

(iv) ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කිරීම සඳහා පවතින බාධා කවරේද;

(v) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යාවත්කාලීන කර සංශෝධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

705/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යුනයිටඩ් පෙට්‍රෝලියම් ලංකා (United Petroleum Lanka) සමාගම සිය මෙහෙයුම් ශ්‍රී ලංකාව තුළ ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම සමාගම ශ්‍රී ලංකාවේ කරන ලද මුළු ආයෝජනයේ වටිනාකම කොපමණද;

(iii) ඉහත සමාගම සමඟ එළැඹ ඇති ගිවිසුම්වල සඳහන් කොන්දේසි කවරේද;

(iv) මෙහෙයුම් කටයුතු සඳහා එම සමාගමට ලබා දුන් ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත සමාගම ශ්‍රී ලංකාවේ සිය මෙහෙයුම් කටයුතු නැවැත්වීමට හේතුවූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

769/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු නැගෙනහිර ප්‍රදේශවල සන්නද්ධ ගැටුම් පැවති කාලසීමාවේදී ක්‍රියාකාරීව පැවති අතුරු සන්නද්ධ කණ්ඩායම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කණ්ඩායම්වල නම්, භාවිතා කරනු ලැබූ ආයුධ වර්ග සහ ආයුධ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම කණ්ඩායම් සන්තකයේ තිබී ආරක්ෂක හමුදා භාරයට ගන්නා ලද ආයුධ සංඛ්‍යාව සහ නීත්‍යානුකූලව භාරදුන් ආයුධ සංඛ්‍යාව එක් එක් කණ්ඩායම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මේ වනවිට එවැනි අතුරු සන්නද්ධ කණ්ඩායම් ක්‍රියාත්මකව පවතින්නේද;

(v) එම කණ්ඩායම් සම්බන්ධයෙන් මේ වනවිට රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

985/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් පුහුණු කිරීම මඟින් උපයා ඇති ආදායම කොපමණද;

(ii) එම ආදායම උපයන මාර්ග කවරේද;

(iii) එම කාල සීමාව තුළ කාර්යාංශයේ පුහුණුව ලබා විදේශගතවූ සහ එම පුහුණුව නොලබා විදේශ ගතවූ ශ්‍රමික සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පළමු වතාවට විදේශගත වන සෑම ශ්‍රමිකයෙකුටම කාර්යාංශය මඟින් පුහුණුවක් ලබා දීම අනිවාර්ය කිරීම වැදගත් බැවින්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1668/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චිය මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයාගේ නම, පදිංචි ලිපිනය සහ ඔහුගේ සේවා කාලය කොපමණද;

(ii) එම නිලධාරියා මීට පෙර මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයෙකු හෝ පොලිස් ස්ථානාධිපතිවරයෙකු ලෙස සේවය කර තිබේද;

(iii) එසේ නම්, එම පොලිස් ස්ථානය කවරේද;

(iv) මූලස්ථාන පොලිස් පරීක්ෂකවරු පත්කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2193/2026

ගරු රුවන් විජේවීර මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන කර්මාන්තපුර සහ කාර්මික ජනපද සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කර්මාන්තපුර හා කාර්මික ජනපද පිහිටුවීමේ අරමුණු කවරේද;

(iii) කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රජය විසින් ඉදිරියේදී පිහිටුවීමට අපේක්ෂිත කර්මාන්තපුර සහ කාර්මික ජනපද තිබේද;

(iv) එසේ නම්, ඒවා කවරේද;

(v) කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2265/2026

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ උපත ලබන දරුවන් සම්බන්ධ සියලුම තොරතුරු රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට වාර්තා වන්නේද;

(ii) එම දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත ප්‍රජාව අතරින් උපත ලබා මාස 03ක් ඇතුළත උප්පැන්න ලියාපදිංචි කර නොමැති දරුවන් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම දරුවන්ගේ උප්පැන්න සහතික ලබා නොගැනීමට බලපා ඇති හේතු සහ ඒ හේතුවෙන් එම දරුවන්ට ඉදිරියේදී මුහුණ දීමට සිදුවන ගැටලු හඳුනාගෙන තිබේද;

(iv) මෙම ප්‍රජාව මුහුණ දෙන ගැටලු විසඳා කඩිනමින් උප්පැන්න සහතික ලබා දීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ එක් එක් කොට්ඨාසය අනුව ක්‍රියාත්මක කරන ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2276/2026

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වැඩිහිටි පුරවැසියෙක් ලෙස සලකනු ලබන වයස් සීමාව කවරේද;

(ii) වර්තමානය වනවිට මෙරට වැඩිහිටි පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය පිහිටුවන ලද දිනය කවරේද;

(iv) එම ආයතනය පිහිටුවීමේ අරමුණ කවරේද;

(v) ආයතනය මඟින් ඉටුකරනු ලබන සේවාවන් කවරේද;

(vi) එම සේවාවන් ලබා ගන්නා වැඩිහිටි පුද්ගලයන් සංඛ්‍යාව සේවාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2289/2026

ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථාව අනුව පළමු ශ්‍රේණියට උසස් වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා වර්ෂ 12ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරින්ගෙන් ඒ සඳහා අයදුම්පත් කැඳවිය යුතු බව දන්නේද;

(ii) 2013 වර්ෂයේ එම සේවයට බඳවාගත් නිලධාරින්ගෙන්, පළමු ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවා තිබේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(iv) එම නිලධාරින් පළමු ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත කාලයේදී අයදුම්පත් නොකැඳවීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(v) එම නිලධාරින් පළමු ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම කඩිනම් කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2292/2026

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මගීන් ප්‍රවාහනය සඳහා යොදවා ඇති පෞද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෞද්ගලික බස් රථ නියාමනය කරනු ලබන ආයතනය කවරේද;

(iii) පෞද්ගලික බස් රථයක් මගී ප්‍රවාහනය සඳහා යෙදවීමේදී වාර්ෂිකව, මාසිකව හෝ දෛනිකව රජයට ගෙවිය යුතු බදු, බලපත්‍ර ගාස්තු සහ වෙනත් ගෙවීම් කවරේද;

(iv) එම ගෙවීම් සිදු කිරීමේදී මුදල් ලැබුණු බවට බස් රථ හිමියන් වෙත ලදුපත් නිකුත් කරන්නේද;

(v) එසේ නම්, එම ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයිනේ බොහෝ පළාත්වල පිහිටි ප්‍රසිද්ධ බස් නැවතුම්පොළවල නතර කරනු ලබන බස් රථවලින් මුදල් අයකරනු ලබන පුද්ගලයන් සිටින බව දන්නේද;

(ii) එම පුද්ගලයන්ට බස් රථවලින් එලෙස මුදල් අයකර ගැනීම සඳහා නීතිමය බලයක් හෝ අවසරයක් තිබේද;

(iii) නොඑසේ නම්, එය වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ක්‍රිකට්,— ශ්‍රී ලංකාවේ ක්‍රිකට් පාලනකරණය, පාලනය කිරීම, නියාමනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් පිහිටුවීම සඳහා ද; යහපාලනය, සුපිළිපන්නභාවය, විනිවිදභාවය, වගකිවයුතුභාවය, ඇතුළත්භාවය සහ සමාන අවස්ථා සැලසීම යන මූලධර්ම හරහා ක්‍රිකට් ක්‍රීඩාවේ වර්ධනය අභිවර්ධනය කිරීම සඳහා ද; සියලු සහභාගීවන්නන්ගේ සුභසාධනය ආරක්ෂා කිරීම සහ දූෂණයෙන් සහ වෙනත් අනිසි ක්‍රියාකාරකම්වලින් ක්‍රිකට් ආරක්ෂා කිරීම සඳහා ද; ශ්‍රී ලංකා ක්‍රිකට් සංස්ථාපනය කිරීම, බලතල සහ කර්තව්‍ය සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඒ හා සම්බන්ධ වූ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

2.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ,— ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදු කරනු ලබන ත්‍රස්තවාදී ක්‍රියාවලින්, ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් වැරදිවලින් සහ ත්‍රස්තවාදය පිළිබඳ වරද සංස්ථාපනය වන ඇතැම් නිශ්චිතව දක්වනු ලබන ක්‍රියාවලින් ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සහ ශ්‍රී ලංකාවේ ජනතාව ආරක්ෂා කිරීම සඳහා ද; ශ්‍රී ලංකාවෙන් පිටත ත්‍රස්තවාදය සඳහා සූදානම් වීමට ශ්‍රී ලංකා ජනරජයට අයත් දේශය සහ එහි ජනතාව භාවිත කිරීම වැළැක්වීම සඳහා ද; යම් ත්‍රස්තවාදී ක්‍රියාවක් හෝ ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් යම් වරදක් සිදුකර ඇත්තා වූ යම් තැනැත්තකු අනාවරණය කරගැනීම, හඳුනාගැනීම, ග්‍රහණය කර ගැනීම, සිරභාරයට ගැනීම, රඳවා තැබීම, පරීක්ෂණ පැවැත්වීම, නඩු පැවරීම සහ දඬුවම් ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විදේශ විනිමය පනත යටතේ රෙගුලාසි (අංක 1),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජුනි 18 දිනැති අංක 2493/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.09.11 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විදේශ විනිමය පනත යටතේ රෙගුලාසි (අංක 2),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජුනි 18 දිනැති අංක 2493/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.09.11 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විදේශ විනිමය පනත යටතේ නියෝගය,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 ජුනි 18 දිනැති අංක 2493/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.09.11 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ යෝජනාව,— ව්‍යාපාර ධාරිතාව ඉහළ නැංවීම, මූල්‍ය ප්‍රවේශය වැඩිදියුණු කිරීම, තාක්ෂණයට අනුගතවීම ප්‍රවර්ධනය කිරීම සහ වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීම මඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) අංශය ශක්තිමත් කිරීමේ අරමුණින් රජය විසින් 'ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන' (මෙතැන් සිට 'SDP' ලෙස හඳුන්වනු ලැබේ) ආරම්භ කර ඇති හෙයින් ද;

සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම මඟින් කෘෂිකාර්මික හා කෘෂි ව්‍යාපාරික අංශ ශක්තිමත් කිරීමේ අරමුණින් රජය විසින් 'කෘෂිකාර්මික අගය දාම මූල්‍යකරණය හා වාණිජකරණ ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන' (මෙතැන් සිට 'AVC' ලෙස හඳුන්වනු ලැබේ) ආරම්භ කර ඇති හෙයින් ද;

එකී 'SDP' වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන සියයක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 100) ප්‍රතිපත්ති පාදක ණයක් (Policy-Based Loan - PBL) සහ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන සියයක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 100) මූල්‍ය අතරමැදි ණයක් (Financial Intermediation Loan - FIL) ද, එකී 'AVC' වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන තිහක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 30) ප්‍රතිපත්ති පාදක ණයක් (PBL) සහ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන හැත්තෑවක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 70) මූල්‍ය අතරමැදි ණයක් (FIL) ද ඇතුළත් මූල්‍ය සහාය සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව (ADB) එකඟ වී ඇති හෙයින් ද;

'SDP' වැඩසටහනට අදාළ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන සියයක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 100ක) ප්‍රමාණයකින් යුත් මූල්‍ය අතරමැදි ණය සංරචකය ද, 'AVC' වැඩසටහනට අදාළ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන හැත්තෑවක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 70ක) ප්‍රමාණයකින් යුත් මූල්‍ය අතරමැදි ණය සංරචකය ද, අවශ්‍ය නිසි විමර්ශනයන් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව හඳුනාගනු ලබන මූල්‍ය ආයතන හරහා සුදුසුකම් ලත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත ණය වශයෙන් ලබා දීමට අපේක්ෂා කරන බැවින් ද, එම මූල්‍ය ආයතන එම අරමුදල් නිකුත් කිරීමේ දී මූල්‍ය අතරමැදියන් ලෙස කටයුතු කරනු ලබන හෙයින් ද;

2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 20 වගන්තියේ (2) උපවගන්තිය ප්‍රකාරව, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය ව්‍යවසායක් නොවන යම් ආයතනයක බැඳීම්වලට අදාළව අරමුදල් ණය වශයෙන් ලබා දීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වන හෙයින් ද;

ඊට අනුකූලව, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 20 වගන්තියේ (2) උපවගන්තිය ප්‍රකාරව, අවශ්‍ය නිසි විමර්ශනයන්ගෙන් අනතුරුව හඳුනාගනු ලැබ ඇති පහත සඳහන් මූල්‍ය ආයතන හරහා, 'ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන' ('SDP') සහ 'කෘෂිකාර්මික අගය දාම මූල්‍යකරණය හා වාණිජකරණ ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන' ('AVC') යන වැඩසටහන්වලට අදාළ මූල්‍ය අතරමැදි ණය සංරචක යටතේ වන අරමුදල් ණය වශයෙන් ලබා දිය යුතු බවටත්, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ සහ අනෙකුත් අදාළ ලිඛිත නීතිවල විධිවිධානවලට අනුකූලව, මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට බලය පැවරිය යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

1. හැටන් නැෂනල් බැංකුව පීඑල්සී;
2. සෙලාන් බැංකුව පීඑල්සී;
3. සම්පත් බැංකුව පීඑල්සී;
4. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී;
5. ඩී.එෆ්.සී.සී බැංකුව පීඑල්සී;
6. පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී;
7. ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී;
8. යූනියන් බැන්ක් ඔෆ් කලම්බො පීඑල්සී;
9. සණස සංවර්ධන බැංකුව පීඑල්සී;
10. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පීඑල්සී; සහ
11. කාගිල්ස් බැංකුව පීඑල්සී (නිසි විමර්ශනයට යටත්ව)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව (2023),— 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරිය පනතේ 15 වගන්තිය යටතේ 2025.07.11 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රණවිරු සේවා අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.11 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.11.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*10.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2023.08.09 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*11.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ වාර්ෂික වාර්තාව (2021/2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.07.24 දින ඉදිරිපත් කරන ලද, 2022.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ 2021/2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*12.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික ලුණු සමාගමේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2021/2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.07.24 දින ඉදිරිපත් කරන ලද, 2022.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ලුණු සමාගමේ 2021/2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*13.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2024.08.21 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*14.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තාව (2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2024.03.20 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*15.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ වාර්ෂික වාර්තාව (2022/2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.06.03 දින ඉදිරිපත් කරන ලද, 2023.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ 2022/2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*16.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික ලුණු සමාගමේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2022/2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.07.24 දින ඉදිරිපත් කරන ලද, 2023.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ලුණු සමාගමේ 2022/2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*17.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.05.20 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*18.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තාව (2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2025.03.05 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*19.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව (2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.03.14 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*20.

කම්කරු අමාත්‍යතුමා,— ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත යටතේ 2024.02.20 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*21.

කම්කරු අමාත්‍යතුමා,— ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනතේ 18 වගන්තිය යටතේ 2024.06.04 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*22.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.08.23 දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*23.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.06 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.24 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*24.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2017),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.06 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.24 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*25.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2018),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.06 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.24 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*26.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*29.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*30.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*31.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— "2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

32.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

33.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

35.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

2389/2026

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2026 වර්ෂය සඳහා විදේශ රැකියා සඳහා යොමු කිරීමට ඉලක්කගත සංඛ්‍යාව කොපමණද;

(ii) 2026.01.01 දින සිට 2026.06.30 දිනට විදේශ රැකියා සඳහා යොමු කළ සංඛ්‍යාව කොපමණද;

(iii) ඉලක්කගත සංඛ්‍යාව සපුරා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට තානාපතිවරයෙකු නොමැති ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ පුරප්පාඩුවී පවතින කාලසීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දූත මණ්ඩල ප්‍රධානීන් අතරින් ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් සහ බාහිරව පත් කර ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2025.01.01 දින සිට මේ දක්වා අමාත්‍යාංශය විසින් විදේශ සංචාර සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) සංචාරය කරන ලද රටවල්, දිනයන්, සංචාරයට සම්බන්ධවූ සංඛ්‍යාව සහ සංචාරවල අරමුණු කවරේද;

(iii) එම එක් එක් සංචාරය සඳහා ගුවන් ගමන්, නවාතැන් සහ දීමනා ඇතුළු මුළු වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අත්සන් කළ ගිවිසුම්, අවබෝධතා ගිවිසුම් සහ ලබාගත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2404/2026

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් වාර්ෂිකව පළාත් ක්‍රීඩා තරඟාවලියක් පවත්වනු ලබන බවත්;

(ii) එම තරඟාවලියට අදාළව ජයග්‍රාහකයන් සඳහා වර්ෂයට අදාළව ක්‍රීඩා වර්ණ ප්‍රදානෝත්සවයක් පවත්වනු ලබන බවත්;

(iii) එය එළඹෙන වර්ෂයේ පළාත් ක්‍රීඩා තරඟයේ අවසන් දිනට පෙර පවත්වා වර්ණ ප්‍රදානය කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2025 වර්ෂයේ මධ්‍යම පළාත් ක්‍රීඩා වර්ණ ප්‍රදානෝත්සවය සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(ii) එසේ නම්, වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසුව වර්ණ ප්‍රදානෝත්සවය පැවැත්වීමට නියම කරනු ලැබූ දිනය කල් තබා තිබේද;

(iv) එසේ නම්, කල් දමන ලද වාර ගණන කොපමණද;

(v) වර්ණ ප්‍රදානෝත්සවය මේ වනවිට පවත්වා අවසන් කර තිබේද;

(vi) නොඑසේ නම්, පැවැත්වීමට නියමිත දිනය කවරේද;

(vii) එම උත්සවය නොපවත්වන්නේ නම්, ඒ සඳහා වෙන් කළ ප්‍රතිපාදනවල වර්තමාන තත්ත්වය කවරේද;

(viii) 2026 වර්ෂයට අදාළ මධ්‍යම පළාත් ක්‍රීඩා අවසන් මහා තරඟය සඳහා දින නියම කර තිබේද;

(ix) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

2406/2026

ගරු මුජිබුර් රහුමාන් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) එක්සත් ජනපදය විසින් මෑතකදී ශ්‍රී ලංකාවට ලබා දුන් ‘TH-57 සී රේන්ජර්’ හෙලිකොප්ටර් යානා —

(i) ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය ඉල්ලීමක් කළ දිනය සහ එක්සත් ජනපදයේ අනුමැතිය ලැබුණු දිනය කවරේද;

(ii) ලබා ගැනීමේ ගිවිසුම අත්සන් කළ දිනය, එහි පාර්ශ්වකරුවන් සහ ලැබුණු ආකාරය (පරිත්‍යාගයක්ද, ණයක්ද, විකුණුමක්ද) කවරේද;

(iii) ඇස්තමේන්තුගත වෙළඳපොළ වටිනාකම එක්සත් ජනපද ඩොලර්වලින් කොපමණද;

(iv) අතිරික්ත ආරක්ෂක උපකරණ (EDA) ලේඛනවල දැක්වෙන මුල් මිලදී ගැනීමේ වටිනාකම සහ වත්මන් වටිනාකම කවරේද;

(v) යෙදවීමට අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් කවරේද;

(vi) මෙරටට ගෙන්වා ගැනීම දක්වා ශ්‍රී ලංකා රජය දැරූ මුළු වියදම කොපමණද;

(vii) ලැබීමෙන් පසු අලුත්වැඩියා කිරීම, යළි ගුවන්ගත කිරීම සහ සහතික කිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

(viii) මේ දක්වා ගුවන්ගතවී ඇති මුළු පියාසර පැය ගණන සහ ඉතිරි පියාසර පැය ගණන එක් එක් යානයේ ලියාපදිංචි අංකය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?